# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1767/28 – 2012 ජූලි 20 වැනි සිකුරාදා – 2012.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: එම්ටීආර්/එල්එන්ඩී/ඒසීකිව්යුඅයි/එල්අයි/3902/ඊඑක්ස්.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉසදීන් නගරය ගමේ පිහිටි මු.පි.මාර 2417 පිඹුරේ කැබලි අංක 117 වශයෙන් දැක්වෙන මතු සඳහන් ඉඩම නූපෙ - ගොඩගම මහා මාර්ගය පුළුල් කිරීම සඳහා අතිරේක ඉඩම් අත්කර ගැනීමට යෝජිතය.

කැබලි අංක 117
ඉඩමේ නම: බෝගහමණ්ඩිය හෙවත් බෝගහකැල්ල; විස්තරය: මාර්ගය; ප්‍රමාණය: හෙක්. 0.0037

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 අගෝස්තු මස 15 වැනි දින පෙ.ව. 10.30ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 අගෝස්තු මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

බී. රණවීර,
ප්‍රාදේශීය ලේකම්,
මාතර.

2012 ජූලි මස 18 වැනි දින,
මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 165

---

ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: බිය/3/1/1/257.

වර්ෂ 2009 සැප්තැම්බර් මස 23 වැනි දින අංක 1620/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමේ සඳහන් මු.පි.ගම්. 3669 දරන පිඹුරේ කැබලි අංක 62 හි විස්තරයකට අදාළව 'පාර', ලෙස සඳහන් කර ඇති කොටස 'ගෙවත්ත' ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දන්වමි.

1A – G 16341 – 355 (2012/07)

**කැබලි අංක 62**

ඉඩමේ නම: නැටවිගහවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: උඩුවරගේ සේපාලිකා පෙරේරා, අංක 347/බී, ඉහල බියන්විල; ප්‍රමාණය: හෙක්. 0.0023.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ කැබලි අංක 62 සඳහා 2012 අගෝස්තු මස 24 වැනි දින පෙ.ව. 10.00ට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 අගෝස්තු මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ටී. ඩී. එස්. පී. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2012 ජූලි මස 18 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 154

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.